සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර II විභාගය - 2022 ජූලි

## (201) උසස් මූල්‍ය ගිණුම්කරණය සහ පිරිවැයකරණය

(Advanced Financial Accounting & Costing)

2022-08-20
පෙරවරු
[8.45 – 12.00]

පිටු ගණන : 10
ප්‍රශ්න ගණන: 07

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන තිබේනම් ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 25)

## 01 වන ප්‍රශ්නය

*අංක **1.1** සිට **1.6** දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** **සීමාසහිත අමීන් සමාගම,** 2018 අප්‍රේල් 01 දින රු.840,000/- ක් පිරිවැය වූ යන්ත්‍රයක් මිලදී ගන්නා අතර, යන්ත්‍ර ප්‍රයෝජනවත් ආයු කාලය පුරා සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි. යන්ත්‍රවල ප්‍රයෝජනවත් ආයු කාලය අවුරුදු 5 ක් වන අතර, ප්‍රයෝජනවත් ආයු කාලය අවසානයේ මෙම යන්ත්‍රයේ සුන්බුන් අගය රු.40,000/- ක් ලෙස ඇස්තමේන්තුගත කර ඇත.

2022 මාර්තු 31 දිනට යන්ත්‍රයේ ධාරණ අගය වූයේ:

(1) රු.160,000/-. (2) රු.128,000/-. (3) රු.200,000/-. (4) රු.320,000/-.

(ලකුණු 02)

**1.2** පහත සඳහන් ඒවා අතුරෙන්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 02 - තොග අනුව, නිවැරදි **නොවන්නේ** කුමක් ද?

(1) පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් වඩා වැඩි අගයට තොග හඳුනාගත යුතුය.

(2) තොග, සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී විකිණීම සඳහා තබා ගනී.

(3) තොගවල මිලදී ගැනීමේ පිරිවැය, ගැනුම් මිල, තීරු බදු හා වෙනත් බදුවලින් සමන්විත වේ.

(4) තොග අගය කිරීම සඳහා ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුතු [First In First Out (FIFO)] ක්‍රමය යොදා ගනී.

(ලකුණු 02)

1.3 පහත සඳහන් තොරතුරු **සීමාසහිත ABC පොදු සමාගමේ** යන්ත්‍රයකට අදාල වේ:

| | | |
|---|---|---|
| ගැනුම් මිල | : | රු.500,000/- |
| ප්‍රයෝජනවත් ආයු කාලය | : | වර්ෂ 4 |
| සුන්බුන් අගය | : | රු.20,000/- |

යන්ත්‍රයේ ක්ෂය කළ හැකි අගය වන්නේ:

(1) රු.120,000/-. (2) රු.520,000/-. (3) රු.480,000/-. (4) රු.500,000/-.

(ලකුණු 02)

1.4 පහත සඳහන් ප්‍රකාශ සළකා බලන්න:

**(a)** ප්‍රාථමික පිරිවැය වක්‍ර ශ්‍රම පිරිවැයෙන් සමන්විත වේ.

**(b)** පොදුකාර්ය, නිෂ්පාදන හා නිෂ්පාදන නොවන පොදුකාර්ය ලෙස බෙදා දැක්විය හැක.

**(c)** දැනටමත් දරා ඇති පිරිවැය, ගිලුනු පිරිවැය ලෙස හඳුන්වනු ලැබේ.

ඉහත ඒවා අතුරෙන්, නිවැරදි ප්‍රකාශ වන්නේ:

(1) **(a)** සහ **(b)** පමණි. (2) **(a)** සහ **(c)** පමණි.

(3) **(b)** සහ **(c)** පමණි. (4) ඉහත සඳහන් සියල්ලම. (ලකුණු 02)

1.5 පහත සඳහන් තොරතුරු නිෂ්පාදන සමාගමක **A අමුද්‍රව්‍ය** සඳහා අදාල වේ:

| | |
|---|---|
| උපරිම භාවිතය | ඒකක 400 |
| අවම භාවිතය | ඒකක 150 |
| පොරොත්තු කාලය | මාස 4 - 8 |
| යලි-ඇණවුම් ප්‍රමාණය | ඒකක 700 |

**A අමුද්‍රව්‍ය** හි යලි-ඇණවුම් මට්ටම වන්නේ:

(1) ඒකක 1,600 කි. (2) ඒකක 3,200 කි. (3) ඒකක 2,800 කි. (4) ඒකක 1,300 කි.

(ලකුණු 02)

1.6 පහත සඳහන් ප්‍රකාශන සළකා බලන්න:

**(a)** යම් හවුල්කරුවෙකු විසින් හවුල් ව්‍යාපාරය වෙනුවෙන් ලබාදෙන ලද ණයක් වෙනුවෙන් 5% ක වාර්ෂික පොලියක් එම හවුල්කරුට ලබාගත හැකිය.

**(b)** හවුල් ව්‍යාපාරයක කළමනාකරණයට සහභාගීවීමට හවුල්කරුවෙකුට අයිතියක් පවතී.

**(c)** යම් හවුල්කරුවෙකුට ඔහුගේ / ඇයගේ තනි කැමැත්තට අනුව නව හවුල්කරුවෙකු හවුල් ව්‍යාපාරය වෙත හඳුන්වාදිය හැක.

ඉහත ප්‍රකාශ අතුරෙන්, 1890 හවුල් ව්‍යාපාර ආඥා පනත අනුව හවුල්කරුවන්ගේ අයිතීන්ට අදාල නිවැරදි ප්‍රකාශන වනුයේ:

(1) **(a)** සහ **(b)** පමණි. (2) **(a)** සහ **(c)** පමණි.

(3) **(b)** සහ **(c)** පමණි. (4) ඉහත සඳහන් සියල්ලම. (ලකුණු 02)

*අංක 1.7 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්නවලට උත්තර, ප්‍රශ්න අංක ද සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.7 පහත සඳහන් නිර්ණායක අනුව, පිරිවැය ගිණුම්කරණය, මූල්‍ය ගිණුම්කරණයෙන් වෙන්කොට දක්වන්න:

(a) කාල පරාසය (Time Span). (b) අරමුණ (Purpose). (ලකුණු 02)

1.8 හවුල් ගිවිසුමක ඇතුළත් වන මූලික කරුණු තුනක්(03) ලැයිස්තුගත කරන්න. (ලකුණු 03)

1.9 **සීමාසහිත XY සමාගම,** එකතු කළ අගය මත බදු [Value Added Tax (VAT)] සඳහා ලියාපදිංචි සමාගමකි. පහත සඳහන් තොරතුරු 2022 මාර්තු මාසය සඳහා උපුටාගෙන ඇත:

| | **රු.** |
|---|---|
| විකුණුම් (එකතු කළ අගය මත බදු රහිතව) | 1,296,000 |
| මිලදී ගැනුම් (එකතු කළ අගය මත බදු රහිතව) | 750,000 |
| ආපසු එවූ ණයට විකුණුම් (එකතු කළ අගය මත බදු රහිතව) | 300,000 |
| 2022 මාර්තු 01 දිනට එකතු කළ අගය මත බදු පාලන ගිණුමෙහි බැර ශේෂය | 245,000 |

සියලුම මිලදී ගැනුම් සහ විකුණුම් සඳහා බදු ඉන්වොයිසි පවතින අතර, අදාල එකතු කළ අගය මත බදු අනුපාතිකය 8% ක් වේ.

2022 මාර්තු 31 දිනට ගෙවිය යුතු එකතු කළ අගය මත බදු (VAT) ගිණුමේ ශේෂය ගණනය කරන්න.
(ලකුණු 04)

1.10 පහත සඳහන් තොරතුරු **සීමාසහිත නදුන් සමාගමේ, කාර්යය අංක 2000** ට අදාල වේ:

| | | |
|---|---|---|
| සෘජු අමුද්‍රව්‍ය | : | කිලෝග්‍රෑම් 1 ක් රු.40/- බැගින් කිලෝග්‍රෑම් 8,000 ක් |
| සෘජු ශ්‍රමය - I වන දෙපාර්තමේන්තුව | : | පැයකට රු.800/- බැගින් පැය 300 |
| සෘජු ශ්‍රමය - II වන දෙපාර්තමේන්තුව | : | පැයකට රු.1,200/- බැගින් පැය 450 |
| නිෂ්පාදන පොදුකාර්ය | : | මුළු ශ්‍රම පිරිවැයෙන් 75% |

සමාගම පිරිවැය මත 20% ලාභයක් පවත්වා ගනී.

**කාර්යය අංක 2000** වෙනුවෙන් අයකළ යුතු මිල ගණනය කරන්න. (ලකුණු 04)
(මුළු ලකුණු 25)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 50)

## 02 වන ප්‍රශ්නය

පහත දැක්වෙන තොරතුරු **හංසිට** අයත් කෝවලස්වාමි ව්‍යාපාරයක් වන **සේෆ්ටි ඩිස්ට්‍රිබියුටර්ස්** හි පොත්වලින් උපුටාගෙන ඇත. **සේෆ්ටි ඩිස්ට්‍රිබියුටර්ස්** පිරිවැය මත 20% ක ස්ථාවර ලාභාන්තිකයක් පවත්වා ගනිමින් සියලුම විකුණුම් අත්පිට මුදලට සිදුකරනු ලබන අතර, ගැනුම්, ණය පදනම මත සිදු කරයි.

කෝවලස්වාමි ව්‍යාපාරයේ වත්කම් සහ වගකීම් පහත සඳහන් පරිදි වේ: *(රු.)*

| | **2022 මාර්තු 31 දිනට** | **2021 මාර්තු 31 දිනට** |
|---|---|---|
| ලී බඩු සහ කාර්යාල උපකරණ | 378,000 | 310,000 |
| තොග | ? | 98,500 |
| ඉදිරියට කළ බදු කුලී ගෙවීම් | ? | 40,000 |
| බැංකුවේ ඇති මුදල් | ? | 27,500 |
| ණයහිමියෝ | 19,200 | 11,500 |
| උපචිත බිල්පත් (ජලය සහ විදුලිය) | 5,000 | 3,000 |

පහත දැක්වෙන අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) යම්කිසි දිනක එකතුකර ගන්නා ලද සියලුම විකුණුම්වලින් ලද ආදායම් එදිනම බැංකුගත කරනු ලබයි.

(2) 2022 මාර්තු 31 දින, තම මුදල් භාවිත කරමින් **හංසි,** ව්‍යාපාරයේ භාවිතය සඳහා රු.150,000/- ක මුදලකට වායු සමීකරණයක් මිලට ගන්නා ලදී.

(3) සාප්පුව පවත්වාගෙන යන්නේ කුලී පදනම මත ලබා ගත් ගොඩනැගිල්ලක වන අතර, ගිවිසුම අනුව, වාර්ෂික කුලිය සෑම වර්ෂයකම සැප්තැම්බර් මස 01 දින ඉදිරි වර්ෂයක කාලය සඳහා ගෙවනු ලබයි. මාසික කුලිය රු.8,000/- කි.

(4) වර්ෂය සඳහා වන ව්‍යාපාරයේ බැංකු ප්‍රකාශනවල පෙන්නුම් කරන ගනුදෙනුවල සාරාංශය පහත දැක්වේ:

| | **රු.** |
|---|---|
| **ලැබීම්:** | |
| මුදල් තැන්පතු | 5,000,000 |
| **ගෙවීම්:** | |
| වෙළෙඳ ණයහිමියෝ | 3,800,000 |
| බදු කුලී | 96,000 |
| වැටුප් සහ වේතන | 360,000 |
| දුරකතන බිල්පත් | 12,000 |
| ජල සහ විදුලි බිල්පත් | 75,000 |
| **හංසිගේ** ගැනිලි | 420,000 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

2022 මාර්තු 31 දිනට **සේෆ්ටි ඩිස්ට්‍රිබියුටර්ස්** හි ශේෂ පිරික්සුම **පිළියෙල කරන්න.** (ලකුණු 10)

## **03** වන ප්‍රශ්නය

**රංගා, තංගා** සහ **දුල්ගා,** පිළිවෙලින් 2:2:1 අනුපාතය යටතේ ලාභා'ලාභ බෙදා ගනිමින් **රන්දූ ෆැෂන්ස්** නමින් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබයි. පහත සඳහන් අතිරේක තොරතුරු ඔබ වෙත සපයා ඇත:

(1) හවුල් ගිවිසුමේ පහත සඳහන් දෑ ඇතුළත් වේ:

- 2021 ජනවාරි 01 දිනට පැවති ප්‍රාග්ධන ශේෂයන් මත වාර්ෂිකව 10% ක පොලියක් ගෙවිය යුතුය.
- ව්‍යාපාරයේ කළමනාකරණ කටයුතුවලට සම්බන්ධවීම වෙනුවෙන් **තංගා** ට මසකට රු.50,000/- බැගින් වේතනයක් හිමි වේ.

(2) 2021 දෙසැම්බර් 31 දින, **දුල්ගා,** හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගැනීමට තීරණය කරන ලද අතර, පහත සඳහන් ගිවිසුම්වලට යටත්ව හවුල් ව්‍යාපාරය එම නමින්ම තව දුරටත් පවත්වාගෙන යාමට **රංගා** සහ **තංගා** විසින් තීරණය කරන ලදී:

- **දුල්ගා** ට ගෙවිය යුතු සියලු ගෙවීම් 2022 ජනවාරි 01 දින සම්පූර්ණයෙන්ම ගෙවා දැමිය යුතු වේ.
- නව හවුල් ව්‍යාපාරයේ ලාභා'ලාභ, **රංගා** සහ **තංගා** අතර, සමසමව බෙදා ගනු ලැබේ.

(3) 2021 දෙසැම්බර් 31 දිනට හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු.3,000,000/- ක් ලෙස අගය කළ අතර, කීර්තිනාම ගිණුමක් පවත්වා ගැනීමකින් තොරව හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් හරහා එය ගැලපීමට තීරණය කරන ලදී.

(4) හවුල් ව්‍යාපාරයේ ගිණුම් පොත්වලින් පහත සඳහන් ශේෂයන් උපුටාගෙන ඇත:

*(රු.'000)*

| | හර | බැර |
|---|---|---|
| 2021 ජනවාරි 01 දිනට ප්‍රාග්ධන ශේෂ: | | |
| **රංගා** | | 8,000 |
| **නංගා** | | 8,000 |
| **දුල්ගා** | | 4,000 |
| 2021 ජනවාරි 01 දිනට ජංගම ගිණුම්: | | |
| **රංගා** | 226 | |
| **නංගා** | | 632 |
| **දුල්ගා** | 50 | |
| 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළදී සිදුකළ ගැනිලි: | | |
| **නංගා** | 550 | |

(5) හවුල් ව්‍යාපාරයේ ජංගම නොවන වත්කම්, 2021 දෙසැම්බර් 31 දින පහත සඳහන් පරිදි ප්‍රත්‍යාගණනය කළ අතර, ප්‍රත්‍යාගණිත අගයන් ගිණුම් පොත්වල පවත්වා ගැනීමට තීරණය කරන ලදී:

*(රු.'000)*

| | **පිරිවැය** | **2021 දෙසැම්බර් 31 දිනට සමුච්චිත ක්ෂයවීම්** | **ප්‍රත්‍යාගණිත අගය** |
|---|---|---|---|
| ඉඩම් සහ ගොඩනැගිලි | 6,000 | 200 | 7,000 |
| මෝටර් වාහන | 2,000 | 500 | 2,600 |

(6) 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ශුද්ධ ලාභය රු.3,800,000/- කි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **රන්දු ෆැෂන්ස්** හි පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම්. (ලකුණු 06)

(b) හවුල්කරුවන්ගේ ජංගම ගිණුම්. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 04 වන ප්‍රශ්නය

කොළඹ ප්‍රදේශයේ ජීවත්වන මහනුවර, ශ්‍රී රෝහන ජාතික පාසලේ ආදි ශිෂ්‍යයන් විසින් ඔවුනොවුන් අතර අන්තර් සම්බන්ධතාවය වර්ධනය කර ගැනීම සඳහා "**Rohanians Colombo**" නමින් වූ සමාජයක් 2019 ජනවාරි 01 දින පිහිටුවා ගන්නා ලදී:

පහත සඳහන් තොරතුරු ඔබට සපයා ඇත:

(1) වාර්ෂික සාමාජික ගාස්තුව රු.15,000/- කි. සමාජය ආරම්භයේදීම, එනම්, 2019 වසරේදී සාමාජිකයන් 100 දෙනෙකු සමාජයට බැඳුනු අතර, 2020 සහ 2021 වසරවලදී පිළිවෙලින් නව සාමාජිකයන් 20 දෙනෙකු හා 10 දෙනෙකු බැඳුණි.

(2) 2020 දෙසැම්බර් 31 දිනට 2020 වර්ෂය සඳහා සාමාජිකයන් 15 දෙනෙකුගේ සාමාජික ගාස්තු හිඟව පැවතුණි. ඔවුන් අතරින් සාමාජිකයන් 12 දෙනෙක් හිඟව පැවති සාමාජික මුදල් 2021 වර්ෂය සඳහා වන සාමාජික මුදල් ද සමඟ 2021 වර්ෂයේදී ගෙවන ලද අතර, සාමාජිකයන් 3 දෙනෙක් 2020 වර්ෂය සඳහා වන සාමාජික මුදල් ගෙවීමකින් තොරව 2021 වර්ෂයේ මුල් භාගයේදී වෙනත් රටකට සංක්‍රමණය වූහ. ඔවුන්ගේ සාමාජිකත්වය අහෝසි කිරීමටත්, 2021 ජනවාරි 01 දිනට ලැබිය යුතු මුදල ලියා හැරීමටත් 2021 ජූනි 01 දින පැවති විධායක කමිටු රැස්වීමේදී තීරණය විය.

(3) 2020 වර්ෂයේදී සාමාජිකයින් 20 දෙනෙක් 2021 වර්ෂය සඳහා වන සිය සාමාජික මුදල් ඉදිරියට ගෙවා තිබූ අතර, 2021 වර්ෂයේදී සාමාජිකයින් 4 දෙනෙක් 2022 වර්ෂය සඳහා වන සිය සාමාජික මුදල් ඉදිරියට ගෙවා තිබුණි.

(4) සමාජය ආරම්භයේදී, සමාජය විසින් රු.230,000/- ක පිරිවැයකට ලැප්ටොප් පරිගණකයක් මිලට ගන්නා ලදී. එය වර්ෂ 5 ක කාලයක් භාවිත කිරීමට අපේක්ෂා කරයි. එය පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය කිරීමට තීරණය කරන ලදී.

(5) 2021 වර්ෂය සඳහා සමාජය විසින් පහත සඳහන් වියදම් දරා ඇත:

- ලිපිද්‍රව්‍ය : රු.45,000/-
- තැපැල් වියදම් : රු.36,000/-
- ගමන් වියදම් : රු.12,000/-
- දුරකතන වියදම් : රු.15,000/-

(6) සමාජයේ වාර්ෂික සුහද හමුව 2021 සැප්තැම්බර් මස 30 දින පැවති අතර, එයට අදාල ගනුදෙනු පහත පරිදි වේ:

- එක් සාමාජිකයෙකු රු.2,000/- බැගින් ගෙවමින් සාමාජිකයන් 90 දෙනෙකු මෙම හමුව සඳහා සහභාගී විය.
- හෝටලය සඳහා රු.50,000/- ක මුදලක් ද, සංගීත කණ්ඩායම සඳහා රු.20,000/- ක මුදලක් ද ගෙවූ අතර, සුහද හමුව වෙනුවෙන් වෙනත් කිසිදු වියදමක් දරා නැත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **Rohanians Colombo සමාජය** වෙනුවෙන් පහත සඳහන් දෑ **පිළියෙල කරන්න:**

(a) සාමාජික ගාස්තු ගිණුම (ලකුණු 05)

(b) ආදායම් සහ වියදම් ගිණුම. (ලකුණු 05)

(මුළු ලකුණු 10)

## **05** වන ප්‍රශ්නය

(A) **රාම් සහ සමාගම** ළමා ඇඳුම් නිෂ්පාදනය කරනු ලබන ඇඟළුම් කර්මාන්තශාලාවකි. සමාගම සතුව පහත දෙපාර්තමේන්තු පවතී:

- කැපුම් දෙපාර්තමේන්තුව.
- මැසීමේ දෙපාර්තමේන්තුව.
- ඇසුරුම් කිරීමේ දෙපාර්තමේන්තුව.
- ගබඩාව.
- නඩත්තු දෙපාර්තමේන්තුව.
- මූල්‍ය සහ මානව සම්පත් දෙපාර්තමේන්තුව.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඉහත ලැයිස්තුවෙන්, සමාගමේ නිෂ්පාදන පිරිවැය මධ්‍යස්ථාන සහ සේවා පිරිවැය මධ්‍යස්ථාන **හඳුනා දක්වන්න**. (ලකුණු 04)

(B) **රාම් සහ සමාගමෙහි** අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සංකලිත කළමනාකරණ ගිණුම්කරණ පද්ධතියක් හඳුන්වාදීමට තීරණය කරන ලදී.

2021 දෙසැම්බර් මාසය සඳහා ව්‍යාපාරයේ පහත සඳහන් ගනුදෙනු සිදුවී ඇත:

| | **රු.** |
|---|---|
| 2021 දෙසැම්බර් 01 දිනට තොගය: | |
| - අමුද්‍රව්‍ය | 250,000 |
| - නොනිමි වැඩ | 300,000 |
| අමුද්‍රව්‍ය මිලදී ගැනුම් - ණයට | 500,000 |
| - අත්පිට මුදලට | 175,000 |
| නිෂ්පාදනය සඳහා නිකුත් කරන ලද අමුද්‍රව්‍ය | 550,000 |
| නිෂ්පාදනය සඳහා වන සෘජු වැටුප් | 600,000 |
| නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය | 250,000 |
| නිමි භාණ්ඩවල නිෂ්පාදන පිරිවැය | 1,600,000 |
| විකුණු භාණ්ඩවල පිරිවැය | 1,550,000 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

2021 දෙසැම්බර් මාසය සඳහා පහත සඳහන් ගිණුම් **පිළියෙල කරන්න**:

(a) අමුද්‍රව්‍ය පාලන ගිණුම (Raw Materials Control Account). (ලකුණු 03)

(b) නොනිමි වැඩ පාලන ගිණුම (WIP Control Account). (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## **06** වන ප්‍රශ්නය

(A) **සීමාසහිත ෆයින් (පෞද්ගලික) සමාගමේ, A නිෂ්පාදිතය,** නිෂ්පාදනය කිරීම සඳහා යොදාගනු ලබන **RM 5,** යන අමුද්‍රව්‍යයට අදාලව පහත සඳහන් තොරතුරු ලබා දී ඇත:

| | |
|---|---|
| මිලදී ගැනීමේ පිරිවැය | කිලෝග්‍රෑමයක් රු.120/- |
| ඇණවුම් කිරීමේ පිරිවැය | ඇණවුමකට රු.28,900/- |
| වාර්ෂික තොග රඳවාගැනීමේ පිරිවැය | කිලෝග්‍රෑමයකට රු.20/- |
| වාර්ෂික නිෂ්පාදනය (**A නිෂ්පාදිතය**) | ඒකක 100,000 |

**A නිෂ්පාදිතයෙහි** එක් ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා **RM 5** ග්‍රෑම් 250 ක් යොදා ගනී**.**

**ඔබ විසින් කළ යුතු දෑ:**

**RM5** අමුද්‍රව්‍ය සඳහා පහත සඳහන් දෑ **ගණනය කරන්න**:

(a) වාර්ෂික ඉල්ලුම. (ලකුණු 02)

(b) ආර්ථික ඇණවුම් ප්‍රමාණය [Economic Order Quantity (EOQ)]. (ලකුණු 03)

(B) **සීමාසහිත ෆයින් (පෞද්ගලික) සමාගම,** කෑලි පදනම මත ශ්‍රමිකයන් සඳහා ගෙවීම් සිදුකරනු ලබයි. 2022 මාර්තු මාසයට අදාලව පහත සඳහන් තොරතුරු උපුටාගෙන ඇත:

| | |
|---|---|
| දිනක සාමාන්‍ය වැඩකරන පැය ගණන | පැය 8 |
| මූලික ගෙවීම | පැයකට රු.125/- |
| ඒකකයක් සඳහා දෙන ලද සම්මත කාලය | මිනිත්තු 4 |
| මූලික ප්‍රසාද අනුපාතිකය | ඉතිරි කරන ලද කාලයෙන් 60% ක් මූලික ගෙවීම මත |
| මසකට වැඩකරනු ලබන දින ගණන | දින 20 |
| මාසය තුල නිෂ්පාදනය කළ ඒකක ප්‍රමාණය | 2,850 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

2022 මාර්තු මාසය සඳහා මුළු ඉපැයීම **ගණනය කරන්න.** (ලකුණු 05)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 25)

## 07 වන ප්‍රශ්නය

2022 මාර්තු 31 දිනට, **සීමාසහිත පර්ල් (පෞද්ගලික) සමාගමේ** ශේෂ පිරික්සුම පහත පරිදි වේ:

*(රු.'000)*

| | **හර** | **බැර** |
|---|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 3,000,000) | | 300,000 |
| 2021 අප්‍රේල් 01 දිනට, රඳවාගත් ඉපැයීම් | | 80,000 |
| 15% ණයකර | | 40,000 |
| කාර්යාල උපකරණ | 15,000 | |
| මෝටර් වාහන | 85,000 | |
| **2021 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය:** | | |
| කාර්යාල උපකරණ | | 9,000 |
| මෝටර් වාහන | | 37,100 |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 359,470 | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | | 105,618 |
| 2022 මාර්තු 31 දිනට, තොගය | 190,552 | |
| බැංකුවේ සහ අතැති මුදල් | 157,169 | |
| විකුණුම් | | 973,880 |
| විකුණුම් පිරිවැය | 606,254 | |
| ඉන්ධන සහ ගමනාගමන වියදම් | 8,540 | |
| කාර්යාල කුලිය | 1,125 | |
| ප්‍රචාරණය හා විකුණුම් කොමිස් | 25,287 | |
| ජලය සහ විදුලිය | 1,309 | |
| බැංකු ගාස්තු | 751 | |
| වැටුප් සහ වේතන | 88,244 | |
| අනෙකුත් පරිපාලන වියදම් | 3,602 | |
| ණයකර පොලී | 3,000 | |
| ගෙවූ ආදායම් බදු | 3,445 | |
| 2021 අප්‍රේල් 01 දිනට වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා ප්‍රතිපාදනය | | 3,150 |
| | **1,548,748** | **1,548,748** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) පිරියත සහ උපකරණ, සරල මාර්ග ක්‍රමයට පිරිවැය මත ක්ෂය කරනු ලබන අතර, පිරියත සහ උපකරණවල ප්‍රයෝජනවත් ආයු කාලය පහත සඳහන් පරිදි වේ:

| | |
|---|---|
| කාර්යාල උපකරණ | වර්ෂ 5 |
| මෝටර් වාහන | වර්ෂ 4 |

(2) 2022 මාර්තු 31 දින පිරිවැය මත ගණනය කරන ලද තොගය ගිණුම් පොත්වල වාර්තා කර ඇත. පසුකාලීනව, එනම් 2022 අප්‍රේල් 15 දින, රු.2,700,000/- ක පිරිවැයකට අගය කරන ලද තොගයෙන් කොටසක් යල් පැන ඇති බව අනාවරණය වූ අතර, එය අප්‍රේල් මාසයේදී රු.2,100,000/- කට විකිණීමට අපේක්ෂා කරයි. නමුත්, මෙය ගිණුම් පොත්වල ගලපා නැත.

(3) ණයගැතියෙකු බුන්වත් වීම නිසා ඔහුගෙන් ලැබිය යුතු වූ රු.70,000/- ක මුදලක් ලියා හැරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරන ලදී. තවද, 2022 මාර්තු 31 දිනට ඉතිරි වෙළෙඳ ලැබිය යුතු මුදල් ශේෂය මත 5% ක ප්‍රතිපාදනයක් සිදුකිරීමට තීරණය කරන ලදී.

(4) 2021/22 තක්සේරු වර්ෂය සඳහා වන අවසන් ආදායම් බදු වගකීම රු.3,825,000/- ක් විය. 2021/22 වර්ෂය සඳහා වන ආදායම් බදු වශයෙන් රු.3,000,000/- ක මුදලක් ප්‍රවර්තන වර්ෂය තුළ ගෙවා ඇත. පසුගිය වර්ෂය සඳහා වන රු.445,000/- ක ඌන වෙන්කිරීම, ප්‍රවර්තන වර්ෂයේදී හඳුනාගෙන පියවා ඇත. නමුත්, එහිදී පසුගිය මූල්‍ය වර්ෂය සඳහා සිදුකරන ලද ආදායම් බදු ප්‍රතිපාදනයේදී මෙය සළකා බලා නොතිබුණි.

(5) 2021 අප්‍රේල් 01 දින, සමාගම විසින් 15% ක ණයකර නිකුත් කර ඇති අතර, ඒ සඳහා වන පොලිය අර්ධ වාර්ෂිකව ගෙවනු ලබයි.

(6) 2022 මාර්තු 31 දිනට උපචිත විදුලි වියදම් වශයෙන් රු.65,000/- ක් ගිණුම්ගත කළ යුතුව ඇත.

(7) මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා වන අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය 2022 මැයි 31 දින ලබාදී ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සීමාසහිත පර්ල් (පෞද්ගලික) සමාගමේ,** කළමනාකාරීත්වයේ භාවිතය සඳහා, පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභා'ලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය (විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය). (ලකුණු 13)

(b) 2022 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 12)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | අඳින්න | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | සඳහන් කරන්න | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | හඳුනා දක්වන්න | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | හඳුනාගන්න | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | අර්ථකතනය කරන්න | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | විස්තර කරන්න | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | පැහැදිලි කරන්න | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැළපීම. | සසඳන්න | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | ප්‍රස්තාර දක්වන්න | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | විසඳන්න | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | පිළියෙල කරන්න | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | ප්‍රදර්ශනය කරන්න | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | භාවිත කරන්න | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | සන්නිවේදනය කරන්න | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | සමානකම් බලන්න | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | විමසන්න | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |